www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියානු ලේඛිකා අරුන්දතී රෝයිට එරෙහිව ත්‍රස්ත විරෝධී නීතිය යටතේ නඩු පැවරීමේ උත්සාහයක්

## Indian writer Arundhati Roy threatened with prosecution under anti-terrorism law

**ක්‍රාන්ති කුමාර විසිනි**

**2010 අප්‍රේල් 26**

බුකර් ත්‍යාගලාභී නවකථාකාරියක්, විවේචිකාවක් හා මානව අයිතීන් පිලිබඳ උද්ඝෝෂිකාවක් වූ අරුන්දතී රෝයිට එරෙහි ව නැගෙනහිර ඉන්දියානු චතිස්ගාර් ප්‍රාන්තයේ ක්‍රියාත්මකවන කුරිරු ත්‍රස්ත විරෝධී නීතිය යටතේ චෝදනා ගොනු කරනුවස් එම ප්‍රාන්තයේ පොලිසිය විසින් "විමර්ශනයන්හි" යෙදෙමින් සිටියි.

මාර්තු 29 වැනි දින ප්‍රකාශයට පත් කෙරුනු 'අවුට්ලුක් ඉන්ඩියා' නම් සඟරාවේ පල කෙරුනු ලිපියක් තුලින් අරුන්දතී රෝයි 'මාඕවාදීන් උත්කර්ෂයට නංවා' ඇතැයි යන කරුන මත විශ්වජිත් මිත්‍ර නම් අයකු විසින් කරන ලද පැමිනිල්ලකට අනුව පොලිසිය අරුන්දතී රෝයි පිලිබඳ තම විමර්ශනය ආරම්භ කොට ඇත. 'සහෝදරවරුන් සමග සැරි සැරුම' යන හිසින් සඟරාවේ පල වූ පිටු 33 කින් සමන්විත ලිපිය තුලින්, ගෝත්‍රික ජනයා නොහොත් ආදීවාසි ජනයා විශාල වශයෙන් නිවැසි කඳුකර වනයේ දන්ඩකාරන්‍යයට රහසින් කල සංචාරයේ දී ඔවුන් සමග ඇය කල සාකච්ඡා ද, පසුව මාඕවාදී ගරිල්ලන්ගේ ක්‍රියාකාරකම් පිලිබඳව කරන ලද නිරීක්ෂනයන්ද පදනම් කර ගනිමින් වාර්තාවක් ඉදිරිපත් කර තිබිනි.

මිත්‍ර තමන් හඳුන්වා ගන්නේ 'සාමාන්‍ය පුරවැසියකු' වශයෙන් වුවත් ඔහු ඉන්දියාවේ අතිශයින් ම ජනාකීර්න ප්‍රාන්තය වන අන්ද්‍රා ප්‍රදේශ් හි පාලක පක්ෂය වන බහුජන් සමාජ් පක්ෂයේ ප්‍රාදේශීය නායකයෙක් බවට වාර්තාවේ.

චතිස්ගාර් ප්‍රාන්තයේ පොලිස්පති විශ්වා රංජන් ජනමාධ්‍යයන්ට ප්‍රකාශ කල පරිදි, "කවර හෝ ඉදිරි පියවරක් ගන්නට පෙර චෝදනා තව දුරටත් විමර්ශනය කල යුතුයි . . . මම නීති විශාරදයන්ගෙන් ඔවුන්ගේ මතයත් තීරනයත් ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටියා."

පොලිස්පති වැඩි දුරටත් කල සැඳහුම් වලින් පෙන්නුම් කෙරෙන්නේ මිත්‍රගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී දුෂ්ට "පැමිනිල්ලෙ"හි වටිනාකමක් ඇතැයි ඔහු විශ්වාස කරන බව යි. පොලිස්පති රංජන් මෙසේ පැවසීයඃ "වෙනත් අයගේ වැරදි අදහස් වලින් අරුන්දතී රෝයි පෙලැඹී සිටිනවාද නැත්නම් ඇත්තටම ඇය සිවිල් සමාජය තුල ඉන්න ඔත්තුකාරියක් ද යන්න මම දන්නෙ නැහැ. මම ඒ ගැන දන්නෙ කෙහොම ද?"

2005 දී චතිස්ගාර් හි සම්මත කල කුප්‍රකට විශේෂ මහජන ආරක්ෂක පනත යටතේ අරුන්දතී රෝයිට එරෙහිව චෝදනා ඉදිරිපත් කරන බවට අනතුරු හඟවා ඇත. හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂයේ කර්තෘත්වයෙන් නිමැවූ මෙම නීතිය මගින් "නීති විරෝධී ක්‍රියාකාරකම්" පිලිබඳව දුරදිග යන අර්ථකථනයක් සම්පාදනය කෙරේ.

මෙකී පනතේ විධිවිධානයන්ට අනුව, යම් ක්‍රියාවක් මගින් හෝ ලිඛිත හෝ වාචික සන්නිවේදනයන් මගින් හෝ "මහජන සාමය"ට "අනතුරක් හෝ එවැනි අනතුරක් පිලිබඳ භීතියක් මතු කෙරෙන්නේ නම්" හෝ ඉන් "නීති පරිපාලනයට" "බාධාවක් මතු කිරීමේ නැඹුරුවක්" හෝ ඉන් "නීත්‍යානුකූලව පිහිටුවනු ලැබූ" කවර හෝ නීතියක හෝ ආයතනයක ආඥාභංගයක් පමුනුවීමට "අනුබල දෙන්නේ නම්" හෝ, එය නීති විරෝධී වන අතර, එය සත් වසරක සිර දඬුවමකට යටත් වීමට හේතු කාරක වනු ඇත.

ඉන්දියාවේ හා ජාත්‍යන්තර සිවිල් නිදහසේ සංවිධාන විසින් මෙකී විශේෂ මහජන ආරක්ෂක පනත දැඩි ලෙස හෙලා දකින ලදී. මෙකී නීති පද්ධතියේ සැබෑ එල්ලය වන්නේ 2004 දී දැනටමත් තහනම් කොට ඇති මාඕවාදී කැරලිකරුවන්ගේ සංවිධානය නොව, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් දරදඬු ලෙස පාගා දැමීම සම්බන්ධයෙන් හා මාඕවාදීන් මර්දනය කිරීමට මුවාවී ඉවක් බවක් නොමැතිව ප්‍රචන්ඩත්වය යෙදීම සම්බන්ධයෙන් ආන්ඩුව හා ආරක්ෂක හමුදා විවේචනය කරන සංවිධාන, පුද්ගලයන් හා රාජ්‍ය නොවන සංවිධාන යයි ඔවුහු චෝදනා කලහ. විශේෂ

මහජන ආරක්ෂක පනත පැනවීමට අඩ වසරකට ප්‍රථම චතිස්ගාර් ආන්ඩුව ගොඩ නැගූ 'පවිත්‍රකරන දඩයම' නම් වූ මාඕවාදී විරෝධී දේශාරක්ෂක හමුදාව විසින් ආන්ඩු විරෝධී කැරලිකරුවන්ට සහයෝගය දෙන්නේ යයි සැකයට පාත්‍ර වූ ගම්මාන ගිනිබත් කිරීම ඇතුලුව ම්ලේච්ඡ ක්‍රියා ගනනාවක්ම කලහ.

අරුන්දතී රෝයිට එරෙහි මෙම ක්‍රියාත්මක වීම සිදු වන්නේ නැගෙනහිර ඉන්දියාවේ 'ගෝත්‍රික තීරුවේ' ජීවත්වන මාඕවාදී කැරුලිකරුවන්ට එරෙහි ව දේශපාලනික මාධ්‍ය උමතුව ඉහල නැංවී තිබෙන අතරවාරයේ දී ය. මේ මස ආරම්භයේ දී, කොංග්‍රස් පක්ෂයේ මූලිකත්වයෙන් පාලනය වන ඉන්දියානු හවුල් ආන්ඩුවෙන් දියත් කල 'ඔපරේෂන් ග්‍රීන් හන්ට්' නැමැති ජාතික මට්ටමෙන් සම්බන්ධීකරනය කරන ලද කැරලි මර්දන ව්‍යාපාරය, මාඕවාදී ගරිල්ලන් විසින් චතිස්ගාර්හි දංතේවාරා දිස්ත්‍රික්කයේ දී ආරක්ෂක භටයින් 76 දෙනෙකු මරනයට පත් කිරීම හේතුවෙන් බරපතල පසු බෑමකට ලක්විය.

දංතේවාරා ප්‍රහාරයේ කැලඹීමත් සමග ම සියලු ම වර්ගයේ ඉන්දියානු විද්‍යුත් හා ජනමාධ්‍ය කරුවන් විසින් අරුන්දතී රෝයිට හා 'ඉකොනොමික් ඇන්ඩ් පොලිටිකල් වීක්ලි' සඟරාවේ කතුවරුන් වැනි අයට විරුද්ධව පියවර ගත යුතු යයි කියා සිටියහ. 'ඔපරේෂන් ග්‍රීන් හන්ට්' හි සැබෑ අර්ථය වන්නේ ආකර, වේලි සහ අනෙකුත් මහා ව්‍යාපාරික "සංවර්ධන" ව්‍යාපෘති සඳහා ගෝත්‍රික ජනයාගේ සම්ප්‍රදායික ඉඩම් අල්ලා ගැනීමට දැරෙන උත්සාහයට එරෙහිව වැඩෙන ගෝත්‍රික විරෝධය මැඩීම සඳහා යයි මෙම කතුවරු ප්‍රසිද්ධියේ අනතුරු හඟවා සිටියහ.

මේ උද්ඝෝෂනය ඇවිලවීමට ස්වදේශ කටයුතු ඇමැති පී. චිදම්බරම් මත් උදව් විය. ඉන්දියාවේ විශාල ම ගෝත්‍රික ප්‍රදේශය සලිත කෙරෙන ප්‍රචන්ඩත්වයට මූලික හේතුව ඉන්දියානු ප්‍රභුවරුන්ගේ සූරාකෑමේ සහ මර්දනයේ ප්‍රතිපත්තින් යයි අවධාරනය කල අය ත්‍රස්තවාදයට උඩගෙඩි දෙන්නන් නොවේනම් ඒ දෙස ඇස් පියා සිටින්නන් බවට 'ඔපරේෂන් ග්‍රීන් හන්ට්' උද්ඝෝෂනයේදී ඔහු නැවත නැවතත් චෝදනා කලේය.

චිදම්බරම් අප්‍රේල් 15 දා ඉන්දියාවේ උත්තර මන්ත්‍රී මන්ඩලය වන රාජසභාව අමතමින්, "මම හිතන්නේ මානව අයිතිවාසිකම් සංවිධානත්, රාජ්‍ය නොවන සංවිධානත් ජීවත් වන්නේ 'අඥානයාගේ පාරාදීසයක'. ඉන්දියාවේ මාඕවාදී කොමිනියුස්ට් පක්ෂය ස්ථාපිත ආන්ඩුව බලෙන් නෙරපා දමා, බලය අල්ලා ගතහොත් මේ රට තුල මානව අයිතිවාසිකම් සංවිධානවලට කටයුතු කිරීමට ඉඩ දෙයි ද? ඔවුන් රාජ්‍ය නොවන සංවිධානවලට ක්‍රියාත්මක වන්නට ඉඩ දෙයි ද? පාර්ලිමේන්තුවක් තියේවි ද?"යි ඇසුවේ ය.

තව දුරටත් ස්වදේශීය ඇමැතිවරයා අරුන්දතී රෝයි විවේචනය කරමින් දැඩි කෝපයෙන් හතිදමමින්, "පිටු 33කින් යුත් ලිපි ලියන අයට ඒ විදියට පිටු 33කින් ලිපි ලියන්න ඉඩ දේවි ද? පිටු 33කින් යුත් ලිපිය පල කරන්න සඟරාවක් තියේවිද?" යැ යි ඇසී ය.

චිදම්බරම්, ඉතා පැහැදිලි ලෙස ම, අරුන්දතී රෝයිට තර්ජනය කොට බියවැද්දීම සහ එදිරිවාදිකම් පෑම හෙලා දැකීම කෙසේ වෙතත් චතිස්ගාර් බිජේපී ආන්ඩුවෙන් අරුන්දතී රෝයිට එරෙහිව සිදුකරන පරීක්ෂනය වහා ම නවත්වන මෙන් ඉල්ලා සිටියේ වත් නැත.

අරුන්දතී රෝයි ඉන්දියානු ධනපති පාලනතන්ත්‍රයේ බද්ධ වෛරයට පාත්‍ර වී ඇත්නම්, එයට හේතු වී ඇත්තේ, ගෝත්‍රික ජනයාගේ උන්නතිය හා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා යුද්ධය දියත් කර ඇතැයි යන ආන්ඩුවේ කුහක කියාපෑම ඇය කෙලින් ම ප්‍රතික්ෂේප කොට හුලං ඇර ඇති නිසා ය. ප්‍රතිභාපූර්න ලේඛිකාවක වූ ඇය ඉන්දියානු රජය විසින් අත්හල හා ගර්හාවට ලක් කල ආදීවාසී ජනයාගේ ඉරනම පිලිබඳ ව සිත් කා වදින අයුරින් කතා කරන අතර, චතිස්ගාර් හා මුලු නැගෙනහිර ගෝත්‍රික තීරුවේ තම අනසක යලි තහවුරු කර ගැනීම සඳහා වන ඉන්දියානු ආන්ඩුවේ ධාවනය පිටුපසින් ඇති ලාභ අරමුනු හෙලි දරව් කරයි.

තව දුරටත් අරුන්දතී රෝයි මෙසේ ලියයි, "පසුගිය වසර පහේ දී හෝ ඊටත් වැඩියෙන් චතිස්ගාර්, ජාර්ඛන්ඩ්, ඔරිස්සා හා බටහිර බෙංගාලයේ ආන්ඩු විසින් වානේ කම්හල් ඉස්පංජි යකඩ කම්හල්, විදුලි බලාගාර, ඇලුමිනියම් පිරිපහදු, වේලි හා පතල් සඳහා ඩොලර් බිලියන ගනනාවක මූල්‍ය වටිනාකම් ඇති අවබෝධතා ගිවිසුම් මහ සංසත සමග හොර රහසේම අත්සන් කෙලේ ය. මෙකී අවබෝධතා ගිවිසුම් සැබෑ මූල්‍යමය වටිනාකම් බවට පරිවර්තනය කිරීම පිනිස ගෝත්‍රික ජනයා පලවා හැරිය යුතු යි. එම නිසා මෙය යුද්ධයකි." යැ යි සඳහන් කලා ය.

මාඕවාදීන්ට බොහෝ පෙර සිට, වරින් වර දක්වන ප්‍රචන්ඩත්වය සහිතව ගෝත්‍රික ජනයා රජයට දක්වන විරුද්ධත්වය පිලිබඳව රෝයි සටහන් කරයි. ඉන්දියානු රාජ්‍යය විසින් දශක ගනනාවක් පුරා ගෙන ගිය කෲරත්වයේ, නොතකා හැරීමේ හා අවතැන්ගත කිරීමේ ප්‍රතිපලයක් ලෙස ගෝත්‍රික ජනයාගෙන් සැලකිය කොටසක් මාඕවාදීන්ගේ ආයුධ සන්නද්ධ අරගලය වටා ඒකරාශී වී ඇති බැව් අරුන්දතී රෝයි නිවැරදිව නිරීක්ෂනය කරයි.

එහෙත් ඇය ඉන්දියාවේ කොමියුනිස්ට් පක්ෂයේ (මාඕවාදී) දේශපාලනය සමග ගනුදෙනු කිරීමේ අඩු අවබෝධයෙන් යුතුය. නමුදු ඇය ඒ සම්බන්ධයෙන් අවිවේචනාත්මකමත් නොවේ.

අරුන්දතී රෝයි මාඕවාදී කැරලිකරුවන් පිලිබඳ මුලුමනින් ම ප්‍රශංසාත්මක ව කතා කලත්, ඇගේ

වාර්තාකරනය හා විවරනය ඉන්දියානු ව්‍යවස්ථාව යටතේ නීත්‍යානුකූල වේ. එහෙත් ඉන්දියානු ප්‍රභූ පැලැන්තිය, ඇමෙරිකානු ප්‍රභූ පැලැන්තිය මෙන් ම, පසුගිය දශක ගනනාවක් පුරා ම මහ පරිමානයෙන් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට ප්‍රහාරය එල්ල කිරීමත්, විරුද්ධවාදීන් අපරාධකරුවන් බවට පත් කිරීමත්, යුක්ති සහගත කර ඇත්තේ 'ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය' යන්නට මුවාවෙනි.

චතිස්ගාර් ප්‍රාන්තයේ අතිශය දරුනු විශේෂ මහජන ආරක්ෂක පනත යටතේ දඬුවම් ලැබීමට නියමිත පලමු වැනි පුද්ගලයා අරුන්දතී රෝයි නොවේ. චතිස්ගාර් ආන්ඩුව විවේචනය කල බෙහෝ අය සිරගත කරන ලදී. ඉන් බොහෝ දෙනෙකු වසර ගනනාවක් සිරබත් කෑහ. ශ්‍රෝතික ජනයා ජීවත්වන ප්‍රදේශයන්හි මූලික සේවාවන්වත් සැපයිමට ආන්ඩුව අපොහොසත් වීම හේතු කොට ගෙන එකී ප්‍රදේශයන්හි ක්‍රියාත්මක වූ රාජ්‍ය නොවන සංවිධාන නායකයන් හා සමාජිකයන් මහජන ආරක්ෂක පනත යටතේ අත්අඩංගුවට ගැනුන අතර එම පනත යටතේ නඩු පැවරින.

මෙකී නීතිය යටතේ ගොදුරු බවට පත් පුද්ගලයන්ගෙන් වඩාත් සුප්‍රසිද්ධ පුද්ගලයා වන්නේ දේශපාලනිකව කොන් කරනු ලැබූ පරිපීඩිත ජනයාට වෛද්‍ය සත්කාර සැපයූ වෛද්‍ය බිනයක් සෙන් ය. මොහු 'සිවිල් විමුක්තිය සඳහා වූ මහජන සංවිධානය' නම් වූ සංවිධානයේ උප සභාපති වේ.

සිරගත කොට සිටි මාඕවාදී නායකයෙකුට ප්‍රතිකාර කිරීමෙන් පසු බොරු චෝදනා ගොතා 2007 මැයි මාසයේ දී වෛද්‍ය සෙන් අත්අඩංගුවට ගන්නා ලදුව චතිස්ගාර් මධ්‍යම සිර කඳවුරේ දෙවසරට වැඩි කාලයක් රඳවා තැබින. ජාතික හා ජාත්‍යන්තර විරෝධතා උද්ඝෝෂනවලින් පසුව පමනක් ඔහු නිදහස් කිරීමට සිදුවූ අතර, ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරනය මැදිහත් වී ඇප මත නිදහස් කිරීමට නියෝග කෙරිනි. කෙසේ නමුත් වෛද්‍ය බිනයක් සෙන්ට එරෙහි චෝදනා කිසිවක් ඉවත් කර නොගත් අතර, ඉන්දියාවේ කොංග්‍රස් පක්ෂ නායකත්වයෙන් යුත් ආන්ඩුව නඩුව දිගට ම කරගෙන යෑමට සහයෝගය පල කිරීමේ සංඥා නිකුත් කෙරින.

'මාඕවාදීන් සමග සම්බන්ධකම් පැවැත්වී යැයි' යන බොරු චෝදනා මත අත්අඩංගුවට ගෙන දින 90 රඳවා ගත් වාර්තාමය චිත්‍රපට අධ්‍යක්ෂක හා ජනමාධ්‍යවේදියකු වන අජේ නිදහස් කිරීම සැමරීම සඳහා 2008 අගෝස්තු මාසේ පැවැත්වූ රැලියේ දී, දිල්ලි විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා මහාචාර්ය නන්දනී ප්‍රාන්තය පුරා ම භීතිය පැතිරෙමින් ඇතැයි යන කරුන අවධානයට ලක් කලා ය. විශේෂ මහජන ආරක්ෂක පනත යටතේ චෝදනා ඉදිරිපත් වේ යයි ඇති බිය හේතු කොට ගෙන ප්‍රවෘත්ති එජන්සි විසින් ෂල්වා ජුඩුම් කෲරත්වය පිලිබඳ තොරතුරු පුරුද්දක් වශයෙන් වාර්තා නොකෙරේ. තවත් ස්වාධීන නීති පර්යේෂකයෙකු වන උෂා රාමනාදන් අවධාරනය කරන පරිදි මධ්‍යකාලීන නීතිවල ආකාරයට ම, මෙකී නීති පද්ධතියේ (විශේෂ මහජන ආරක්ෂක පනත) ද නීති ප්‍රතිපාදන විවේචනය කිරීම 'නීති විරෝධී' යයි වගන්ති ඇතුලත් කොට ඇත.

© www.wsws.org